# විනය හා සමන්තපාසාදිකාව (විනයට්ඨකථා)

බලගල්ල, සරස්වතී මහ පිරිවෙනෙහි ආචාර්ය.
ගෞරව ශාස්ත්‍රවේදී පහලගම ධම්මික හිමි.

පුද්ගලයාගේ සංවරය හික්මීම ඇති කරන්නේ විනය තුළිනි. විනය යන පදය සැකසී ඇත්තේ වි පූර්ව නී නයෙ (පැමිනීමෙහි, හික්මීමෙහි) ධාතුවට ති වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචන ප්‍රත්‍ය එක්වීමෙනි. එයින් හික්මීම, විනාශ කිරීම, යටපත් කිරීම, භික්ෂූන්වහන්සේට අදාළ ශික්ෂා කොටස, ඒ ශික්ෂාවන් ඇතුළත් දහම් කොටස[1] යනුවෙන් ද හික්මීම හා විනය පිටකය[2] වශයෙන් ද "සූත්‍ර ධර්මයන්හි පර්යායෙන් රාග විනය දෝස විනය මෝහ විනය සංවරය, ප්‍රහාණය, ප්‍රත්‍යවේක්ෂණය යන මෙය විනය නම් වෙයි"[3] විනය හෙවත් හික්මීම අවශ්‍ය වන්නේ ආයති සංවරයෙහි පිහිටීම සඳහාය. යෑම (ගතෙ) සිටීම (ඨිතෙ) හිඳීම (නිසින්නෙ) නිදාගැනීම (ජාගරකාරී) සිවු ඉරියව්වලදී සංවරවීම අවශ්‍ය වෙයි. එහි දී කායිකව සංවරවීම සඳහා මානසික සංවරය හෙවත් චිත්ත ඒකාග්‍රතාවය ප්‍රමුඛ වෙයි. හික්මීම ඇතිවන්නේ සීලයෙනි. කය වචන දෙකෙහි සංවරය සීලයයි.[4] කායිකව ප්‍රාණඝාතය, අදින්නාදානය, කාමේසුමිච්ඡාචාරය හා සුරාමේරය යන්න සිදුනොකරනවානම් කායිකව සංවරය ඇති වෙයි. වාචසික සංවරය ඇතිවන්නේ මුසාවාදය, පරුෂාවාචා, පිසුනාවාචා හා සම්පලප්පලාපා තුළිනි. මෙම සීලයට අවැසි පියවර විනය තුළින්

---

[1] පාලි සිංහල අකාරාදිය, 451 පිටුව, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. 1998

[2] පාලි සිංහල ශබ්දකෝෂය, මඩිතියවෙල සුමංගල හිමි, 454 පිටුව, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. 1965

[3] සමන්තපාසාදිකා, 943 පිටුව, 1948. සුත්තන්තපරියායෙන රාගවිනයො දොස විනයො මොහ විනයො සංවරො පහාණං පටිසංඛාති අයං විනයො නාම.

[4] විසුද්ධිමග්ග, 06 පිටුව, 1919. අවසෙසෙසු කෙනට්ඨෙන සීලන්ති සීලට්ඨේන සීලං කිම්දං සීලානං නාම සමාධානං වා කායාමාදීනං සුසීල්‍යවසෙන අවිප්පකිණ්ණතානි අත්ථො. සමන්තපාසාදිකා, 1026 පිටුව, විනයස්ස ද්වේ මූලානි කායො චේව වාචා ච.

උගන්වනු ලබයි. විනය යන්නට සමන්තපාසාදිකාව දෙනු ලබන අර්ථකථනය වන්නේ,

"විවිධ විසෙසනයත්තා විනයතො චේව කායවාචානං
විනයත්ථවිදූහි අයං විනයො විනයොති අක්ඛාතො"[5]

නොයෙක් ආකාර වූ නය ඇති බැවින් ද කය වචන දෙකෙහි හික්මීම ඇති හෙයින් ද විනය පිළිබඳ දැනුම ඇති අය විනය වශයෙන් හැඳින්වීම කළ හෙයින් ද විනය නම් වෙයි. පස් ආකාර වූ ප්‍රාතිමෝක්ෂ උද්දේස පාරාජිකා ආදී ආපත්ති මාතිකා විභංග ආදී ප්‍රභේදගත බෙදීමකි, විශේෂ වූ දළ්හී කර්ම හා ලිහිල් කිරීමේ යෙදීම් කායික වාචසික වැර චරණයන් නිශේධනය ද මෙහි කය වචන හික්මවයි, ඒ නිසා විවිධනය ඇති බැවින් කය වචනය හික්මවන හෙයින් විනය වශයෙන් ව්‍යවහාර වෙයි.[6] මෙහි "කාය වාචානං" යන්නෙන් එහි සංවරය උක්තානීකරණය වෙයි. ඒ අනුව විනය අර්ථත්‍රයක අර්ථාන්විත බව පෙනේ. "විනෙතී සික්ඛතීති විනයො" හික්මීම, "විවිධනය විසෙසනයමෙතස්සාති විනයො" නොයෙක් ආකාර බෙදීම, විනයතීති නාසෙතීති වුත්තං හොති, විනාශාර්ථය, රාගවිනය, දොසවිනය, මොහවිනය වශයෙන් එහි ව්‍යුපශමය අර්ථවත්වෙයි.

විනය දේශනාව ශාසනාරම්භයේදී ම සිදු වී නැත. වරක් සාරිපුත්ත හිමියන් බුදුරදුන්ගෙන් විනය ශික්ෂාපද දේශනා කරන ලෙස ඉල්ලා සිටිය ද එහි දී තමන් වහන්සේ සුදුසු කාලයේ දී විනය දෙසන බව දේශනා කළහ.[7] බුද්ධත්වයෙන් මුල්විසි වසින්

---

[5] දීඝනිකාය අට්ඨකථා, 13 පිටුව, 1918.

[6] එම, විවිධා හි එත්ථ පඤ්චපාතිමොබුද්දෙසපාරාජිකාදිසත්ත ආපත්තික්ඛධමාතිකාවිභංගාපත්ති භෙදනයා, විසෙසභූතා ච දළ්හීකම්ම සිථිල කරණප්පයොජනා අනුප්පඤ්ඤත්තිනයා, කායිකවාචසික අජ්ඣාචරනිසෙධනතො චෙස කායං වාචඤ්ච විනෙතිත තස්මා විවිධනයත්තා විසෙසනයත්තා කායවාචානං ච විනයතො නිනයො'ති අක්ඛාතො,

[7] පරාජිකාපාළි, 22 පිටුව. ආගමෙහි ත්වං සාරිපුත්ත ආගමෙහි ත්වං සාරිපුත්ත තථාගතො'ව තත්ථ කාලං ජානිස්සති. න තාව සාරිපුත්ත සත්ථා සාවකානං

අනතුරුව සිදුකොට තිබේ. මුල් යුගයේ භික්ෂූන්වහන්සේ ඕවාද ප්‍රාතිමොක්ෂයට අනුව කටයුතු කළහ. එනම්,

"සබ්බපාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියෝදපනං
එතං බුද්ධානසාසනං."[8]

සියලු පාපයන් දුරු කිරීමත් කුසල් දහම් වර්ධනයත් ස්වකීය චිත්තසන්තානය පවිත්‍ර කිරීමත් යන බුද්ධෝපදේශය අනුගමනය කළත් කල් ගතවීමේ දී ශාසනාභ්‍යන්තරයේ ආසවට්ඨානීය ධර්මයන් පහළවිය. එනම්,

01. රත්තඤ්ඤුමහත්තං
02. වෙපුල්ලමහත්තං
03. ලාභග්ගමහත්තං
04. බාහුසච්චමහත්තං[9]

සංඝයාවහන්සේ අතර චිරරාත්‍රඥතාය ඇතිවීමත් පිරිසවශයෙන් වැඩිවීමත් ලාභසත්කාර වැඩිවීමත් බහුශ්‍රැත බවින් යුක්තවීමත් යන මානසිකමය හේතු දෙකක් හා භෞතිමය හේතු දෙකක් පාදක කොට ගෙන ආඥාදේශනාව සිදු කර ඇත. එම විනය හෙවත් ප්‍රඥප්තීන්ගේ ආධ්‍යාශය වන්නේ,

01. සංඝයාගේ සුවය
02. සංඝයාගේ පහසුව
03. දුසිලුන්ට නිග්‍රහ කිරීම

---

සික්ඛාපදං පඤ්ඤාපෙමි. න උද්දිසති. පාතිමොක්ඛං යාව න ඉධෙකච්චේ ආසවට්ඨානීයා ධම්මා සංඝෙ පාතුභවන්ති.

[8] ඛුද්දකනිකාය ද්‍යද්‍ය, 72 පිටුව.

[9] පරාජිකාපාළි, 22 පිටුව. න තාව සාරිපුත්ත ඉධෙකච්චේ ආසවට්ඨානීයා ධම්මා සංඝෙ පාතුභවන්ති යාව සංඝො රත්තඤ්ඤුමහත්තං පත්තො හොති......වෙපුල්ලමහත්තං......ලාභග්ගමහත්තං.....බාහුසච්චමහත්තං

04. සුසිලුන්ගේ පහසුව

05. මෙලොව යහපත

06. පරලොව යහපත

07. අපැදුනවුන්ගේ පැහැදීම

08. පැහැදුනවුන්ගේ පැහැදීම වැඩි දියුණු වීම

09. සදධර්මයේ ප්‍රතිෂ්ඨාපනය

10. විනයට අනුග්‍රහය[10]

සංවරයෙන් යුත්ත පර්ශදයක් වශයෙන් විමුත්තිගාමී මාර්ගයෙහි ස්ථාපිත කරවීම බව පෙනේ. මේ ශික්ෂා අන්තර්ගත කොට ප්‍රථම ධර්මවිනය සංගායනාවේ දී සිදු කළ සංග්‍රහය විනය පිටකය වශයෙන් හඳුන්වනු ලබයි. ප්‍රාතිමොක්ෂ දෙකත් විසිදෙකක් වූ ඛන්ධකයන් හා දහසයක් වූ පරිවාරත් විනය පිටකය නමින් හඳුන්වනු ලබයි.[11] නමුත් දීඝනිකාය අට්ඨකථා පද්‍ය කොටසේ දී විනය වශයෙන් උභතො විභංගයත් අභිවිනය වශයෙන් ඛන්ධක හා පරිවාර හඳුන්වයි.[12] විනය පිටකය පිළිබඳ ඊසප්ක් ජය්රබ ඞ්අ සහ ඒමරසජා උසබඑැරබසඑ' අදහස් කරන්නේ මෙසේය, "විනය පිටකය නම් විනය පිළිබඳ ලේඛන සංග්‍රහයක් නොහොත් භික්ෂුවගේ ශික්ෂණය පිළිබඳ නීතිමාලාවයි, එහි බෞද්ධ මහාසංඝයාවහන්සේ පිළිබඳ නීති සහ භික්ෂු භික්ෂුනීන්ගේ එදිනෙදා ජීවිතය, පාලනය, සාමණේර ජීවිතය හා බැඳි නීති, ඇවැත් පිළිබඳ නිතී, වස්කාලය, සේනාසන, චීවර, ගිලන්පස හා

---

[10] පරාජිකාපාළි, 48 පිටුව. තෙනහහි භික්ඛවේ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤාපෙමි දස අත්ථ වසේ විච්ච සංඝසුට්ඨුතාය සංඝඵාසුතාය දුම්මන්නංකූනං පුග්ගලානං නිග්ගහාය පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය අප්පසන්නානංනවා පසාදාය පසන්නානංවා භියොභාවාය සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය එවඤ්ච පනා භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

[11] දීඝනිකාය අට්ඨකථා, කථං පිටක වසන තිවිධං සබ්බම්පි චෙතං විනය පිටකං සුත්තන්ත පිටකං අභිධම්මපිටකන්ති තිප්පභෙද මේව හොති, තත්ථ පඨම සංගීතියං සංගීතඤ්ච අසංගීතඤ්ච සබ්බම්පි සමොධානෙත්වා උභයානි පාතිමොක්ඛානි ද්වෙ විභංගානි, ද්වාවීසති ඛන්ධකා සොළසපරිවාති ඉදං විනය පිටකං නාම,

[12] දීඝනිකාය, විනයොති උභතො විභංගා අභිවිනයොති ඛන්ධකපරිවාරා,

සංඝයාගේ සාමග්‍රිය පිළිබඳ"[13] ප්‍රථම සංගායනාවේ දී විනය පිළිබඳ වස්තු, නිදාන, පුද්ගල, පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති ආපත්ති හා අනාපත්ති,[14] න්‍යාය හතක් යොදාගනිමින් කළ භික්ෂු භික්ෂුණීන්ගේ ශික්ෂාන්තර්ගත සංග්‍රහය විනය පිටකය වශයෙන් ව්‍යවහාර කරයි.

01. පාරාජිකාපාළි
02. පාචිත්තියපාළි
03. මහාවග්ගපාළි
04. චුල්ලවග්ගපාළි
05. පරිවාරපාළි

යන ග්‍රන්ථ පහ භික්ෂු භික්ෂුණී උභයපාර්ශවීය ශික්ෂණය උගන්වන විනය නීති අන්තර්ගත ථෙරවාදී විනය පිටකය වශයෙන් හඳුන්වයි. මෙහි පිටක ශබ්දය සමූහාර්ථවත්ව යොදා ඇත.

පාරාජිකාපාළි නම් උභය සංඝයා විෂයෙහි අකරණීය ධර්ම පුරස්සරව ඉදිරිපත් කරන ග්‍රන්ථයයි. එහි අකරණීය වශයෙන් පාරාජිකා හතර උගන්වනු ලබන අතර ඇවැත් ආදී දේසනා ක්‍රමයෙන් පාරිශුද්ධ විය හැකි ශික්ෂා අතර සංඝාදිසෙස් දහතුන අනියත දෙක නිස්සග්ගිය තිහ මුල්කොට ගනිමින් එහි සප්තනය ක්‍රමයෙන් කරුණු ඉදිරිපත් කරයි. පාචිත්තියපාළි උභයසංඝයා කෙරෙහි විභංග වශයෙන් දෙයාකාර වෙයි. භික්ඛු විභංගය තුළ පාචිත්තිය අනූදෙක පාටිදේසනීය හතර සේඛියා හැත්තෑපහ පිළිබඳ විස්තර කරයි. භික්ඛුණී විභංගය තුළ පාරාජිකා හතර සංඝාදිසෙස හතර පාචිත්තිය හැත්තෑ හතර පාටිදේසනීය හතර ආදී භික්ෂුණීන්ට පනවන ලද

---

13 **A History of Pali Literature,** Vol: i, The Vinaya Pitaka really means a basket containing manuscripts of vinaya or the rules discipline. It contains rules and regulation for the management of the Buddhist samgha, and for the conduct of daily life of monks and nuns. Rules for reception into the Order, for the rainy season, for housing, clothing, medicinal remedies and legal procedure in Case of Schism, are also included in it, **A History of Indian Literature** Vol: ii, 21 p, Maurice Winternitz, Delhi, 1977.

14 චුල්ලවග්ගපාළි, 550 පිටුව, වත්ථුම්හි පුච්ඡි නිදානම්පි පුච්ඡි පුග්ගලම්පි පුච්ඡි පඤ්ඤත්තිම්පි පුච්ඡි අනුපඤ්ඤත්තිම්පි පුච්ඡි ආපත්තිම්පි පුච්ඡි එකෙනෙව උපායෙන උභතො විභංගා පුච්ඡි,

ශික්ෂාන්තර්ගත වෙයි. භික්ෂූන්වහන්සේට පැන වූ සියලු ශික්ෂා භික්ෂූණීන් ආරක්ෂා කිරීම බුද්ධ නියමය වෙයි.[15] මහාවග්ග තුළ මහාඛන්ධකය, උපොසථක්ඛන්ධකය, වස්සූපනායිකක්ඛන්ධකය, පවාරණක්ඛන්ධකය, චම්පෙය්‍යක්ඛන්ධකය, භේසජ්ජක්ඛන්ධකය, කඨිනක්ඛන්ධය, චීවරක්ඛන්ධකය, කොසම්බක්ඛන්ධකය ඛන්ධක දහයකි. චුල්ලවග්ග තුළ කම්මක්ඛන්ධය, පාරිවාසිකක්ඛන්ධකය, සමුච්චයක්ඛන්ධකය, සමථක්ඛන්ධකය, ......... ඛුද්දකවත්ථුක්ඛන්ධකය, සේනාසනක්ඛන්ධකය, සංඝභේදනක්ඛන්ධකය, වත්තක්ඛන්ධකය, පාතිමොක්ඛන්ධකය, භික්ඛුණික්ඛන්ධකය, පංචසතිකක්ඛදන්ධකය, සත්තසතිකක්ඛන්ධකය, දොළසකි. මෙම දෙවිසි ඛන්ධකාන්තර්ගතයෙහි උභය සංඝයාට කළ යුතු හා නොකළ යුතු කරුණු ඉදිරිපත් කරයි. සෞඛ්‍යවිධි, ආරාම කළමනාකරණය හා ඔවුනොවුන් අතර සුවපහසුව ඇතිවන ඉගැන්වීම් ප්‍රථම සංගායනා වාර්තා ද අන්තර්ගත වෙයි. නමින් හඳුන්වන කොටස් විසිදෙකක් ඇත. පරිවාරපාළි ආධුනිකයන් සඳහා ශික්ෂණය ලබාදෙන්නා වූ විනය ග්‍රන්ථයක් ලෙස සකසා තිබේ. විනය පිටකය මුල්කොට ගෙන පසුකාලයේ දී විනය සාහිත්‍යයක් නිර්මාණය වී ඇත. ඒ බව, ''විනය පිටකය වනාහි පාරාජිකාදි පෙළපොත් පසකින් හා උභයමාතෘකාවකින් ද සමන්තපාසාදිකා නම් විනය අටුවාවකින් ද කංඛාවිතරණී නම් මාතෘකා අටුවාවකින් ද සාරත්ථදීපනී, විමතිවිනොදනී, වජිරබුද්ධි යන ටීකාත්‍රයකින් ද ඛුද්දකසික්ඛා, මූලසික්ඛා, විනය විනිච්ඡය පාලිමුත්තකවිනය විනිච්ඡය ආදී ප්‍රකරණයන්ගෙන් හා ඒ ප්‍රකරණයන්ගේ ටීකාකානුටීකා ලීනාර්ථ වර්ණනාවලින් ද සමුපලක්ෂිතය''[16]

අට්ඨකථාවල දී විනය පිටක පිළිවෙළින් හඳුන්වා ඇත්තේ උභයානි පාතිමොක්ඛානි, ද්වාවීසති ඛන්ධකා, සොළසපරිවාරා යනුවෙනි. මෙකී විනය පිටකය නමින් හඳුනවන ග්‍රන්ථ පහ සඳහා කළ අට්ඨකථාව හෙවත් අර්ථවර්ණණාව ''විනයට්ඨකථා නාම

---

15 භික්ඛුණිඛන්ධකය, 480 පිටුව.
16 විනයමුඡ්ටිය, 1,2 පිටු. යූ. ඇම්. විමලසාර හිමි, 1912

සමන්තපාසාදිකා''[17] තදීය විනයට්ඨකථාව ප්‍රාරම්භයේ දී විනය පිටකයට අර්ථවර්ණනා සිදුකරන බව දක්වයි. ''විනය යනුවෙන් කියන ලද බැවින් ප්‍රථමයෙන් විනය තීර්ණ කළ යුතුය, එම නිසා මෙය කියනු ලැබේ. විනය නම් මෙහි සියලු විනය පිටකය ම අදහස් කරන ලදී මේ විනය වර්ණනා කිරීම සඳහා මේ මාතෘකාවන්ය, දෙසීම, කාලය, කුමන කරුණක් මුල්කොට ගෙන ද දැරීම මා පිහිටීම දක්වමින් නොයෙක් ආකාරයෙන් විනයෙහි අර්ථවර්ණනා කරන්නෙමි''[18] මෙයින් පැහැදිලි වන්නේ මුලු විනය පිටකයටම අර්ථවර්ණනා සිදුකළ බවයි. සමන්තපාසාදිකා යන්නට විනයටීකාර්ථකථනය වන්නේ ''සමන්තතො සබ්බසො පසාදං ජනෙන්තී'ති'' හාත්පසින් ම හැම ආකාරයෙන් ම ප්‍රසාදය උපදවන හෙයින් මෙකී නාමය යෝජනා කොට ඇත. බුද්ධඝෝස හිමියන් ලක්දිවට පැමිණ ප්‍රථමයෙන් විසුද්ධිමග්ගය රචනා කළත් පෙළට අන්තර්ගත අට්ඨකථා අතරින් ප්‍රථමයෙන් කළ අට්ඨකථාව ලෙස මෙය සැලකිය හැකිය. විනයො නාම සාසනස්ස ආයු වශයෙන් විනය ශාසනයේ ආයුෂ වශයෙන් අට්ඨකථාවේ දී මෙන් ද ප්‍රථම සංගායනාවේ ක්‍රියා කළ ආකාරයෙන් එය තහවුරු වෙයි. විනයට්ඨකථාව රචනය සඳහා නිමන්ත්‍රණය කොට ඇත්තේ බුද්ධසිරි නම් තෙරකෙනෙකු විසින්ය.

''තස්මා ඉමං පාලියානුරූපං
සංවණ්ණනා'දානි සමාරභිස්සං,
අජ්ඣෙසනං බුද්ධසිරිව්හයස්ස

---

[17] සංයුත්තනිකාය අට්ඨකථා, 28 පිටුව, 1927. සමන්තපාසාදිකා 1057 පිටුව. විමතිවිනෝදනී, 20 පිටුව, බෙරතුඩුවේ ධම්මාධාරතිස්ස හිමි, 1935. **A History of Indian Literature** Vol: ii, 191 p, Maurice Winternitz, Delhi, 1977.

[18] සමන්තපාසාදිකා, 03 පිටුව. තත්ථ තං වණ්ණයිස්සං විනයන්ති වුත්තන්තා විනයො තාව වවත්ථපෙතබ්බො තෙනෙතං වුච්චති, විනයො නාම ඉධ සකලං විනය පිටකං අධිප්පෙතං සංවණ්ණනත්ථං පනස්ස අයං මාතිකා,
වුත්තං යෙන තදා යස්මා ධාරිතං යෙන චාබතං,
යත්ථප්පතිට්ඨිතඤ්චේත මෙතං වත්වා විධිං තතො.
තෙනාති'ති ආදිපාඨස්ස අත්ථං නානප්පකාරතො,
දස්සයන්තො කරිස්සාමි විනයස්සත්ථවණ්ණනන්ති.

ථෙරස්ස සම්මා සමනුස්සරන්තො''[19]

මෙහි පරමාර්කථනය වන්නේ අන්තහජනය නොකළ මැනවින් ප්‍රතිෂ්ඨාපිත වූ බුද්ධසාසනය යමක් පිහිටි කළ ප්‍රතිෂ්ඨාපන වූයේ ද ඒ විනය මිශ්‍රවූවක් නොකොට පැරණි ආචාර්යවරුන්ගේ මතයන් ඇසුරු කොට ගනිමින් විසිතුරු වූ ණය ක්‍රමවලින් විනය වර්ණනා කරන බව ප්‍රකාශ කරයි.[20] මෙහි කර්තෘත්වය බුද්ධඝෝස හිමියන් බව විනයට්ඨකථාවසානයේ දී ''බුද්ධඝොසොති ගරූහි ගහිතනාමධෙය්‍යන ථෙරෙන කතා අයං සමන්තපාසාදිකා නාම විනය සංවණ්ණනා'' සඳහන් කොට තිබේ. විනයට්ඨකථාව රචනය සඳහා මූලාශ්‍ර වශයෙන් මහාපච්චරිය, කුරුන්දි, ආදී සීහලට්ඨකතා භාවිතා කොට තිබේ.[21]

සමන්තපාසාදිකාව ශික්ෂාවන්ට අර්ථවණ්ණනා දැක්වීමට ප්‍රථමයෙන් බාහිර නිදාන වණ්ණනය ලෙස තේමාගත කරමින් ධර්ම සංගායනාදී ඉතිහාස කථා ඇතුළත් කොට තිබේ. එහි දී බුද්ධවචනය පිටක නිකාය වශයෙන් විභජනයක් ඉදිරිපත් කරයි. නිකාය වශයෙන් පහකට බෙදීමෙන් අනතුරුව අංග වශයෙන් නවයකට විභජනය කරයි. ''අංගවසෙන නවවිධං සබ්බමෙවහිදං සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වේදල්ලන්ති නවප්පබේදං හොති''[22] (සුත්තං) සුත්තාංගයට උභතො

---

[19] සමන්තපාසාදිකා, පිටුව. **A History of Pali Literature. Vol:** ii, It was written by buddhaghosa at the request of the there Buddhasiri.

[20] සමන්තපාසාදිකා, පිටුව. යස්මිං ඨිතෙ සාසනමට්ඨිතස්ස
පතිට්ඨිතං හොති සුසන්ඨිතස්ස,
තං වණ්ණයිස්සං විනයං අමිස්සං
නිස්සාය පුබ්බාචරියානුභාවං.
කාමං ච පුබ්බාචරියාසභෙහි
ඤාණම්බුනිද්ධොතමලාසවෙහි,
විසුද්ධ විජ්ජාපටිසම්භිදෙහි
සද්ධම්මසංවණ්ණනකොවිදෙහි.
සල්ලේඛියෙ නො සුලභපමෙහි
මහාවිහාරස්ස ධජූපමෙහි,
සංවණ්ණිකොයං විනයො නයෙහි
චිත්තේහි සම්බුද්ධවරන්වයෙහි.

[21] සමන්තපාසාදිකා,

[22] එම,

විභංගය, චුල්ලනිද්දේස, මහානිද්දේස, විසිදෙකක් වූ ඛන්ධක, සොළොස්පරිවාර, සුත්තනිපාතයෙහි මංගල, රතන, නාලක, තුවටක යන සූත්‍ර හා සූත්‍ර නාමයෙන් භාවිත බුද්ධවචනය අයත්වෙයි.[23] (ගෙය්‍යං) ගෙය්‍යාංගයට ගාථා සහිත සියලු සූත්‍රත් විශේෂයෙන් සංයුත්ත නිකායේ සගාථක වර්ගයත් අයත්වෙයි.[24] (වෙය්‍යාකරණං) වෙය්‍යාකරණාංගයට අභිධර්මපිටකයත් ගාථා නැති සූත්‍රත් මෙම අංගය හැර අනෙක් අංගයන් අටට සංග්‍රහ නොකළ බුද්ධවචනයත් ඇතුළත්ය.[25] (ගාථා) ගාථාංගයට ධම්මපද, ථෙරථෙරීගාථා සුත්තනිපාතයෙහි සංඥානාමය සඳහා සූත්‍ර නාමය නොවන පැහැදිලිව ම සූත්‍ර නාමය යොදා ඇති ගාථාය.[26] (උදානං) උදානාංගයට සොම්නසින් යුක්ත අසූ දෙකක් වූ ප්‍රකාශනය.[27] (ඉතිවුත්තකං) ඉතිවුත්තකාංයට බුදුරදුන් විසින් මෙය මෙසේ වදාරණ ලදී වශයෙන් දේශනා කළ එකසිය දොළසක් සූත්‍රයන්ය.[28] (ජාතකං) ජාතකාන්ගයට අපණ්ණකාදි ජාතකය මුල්කොට පන්සිය පනසක් වූ ජාතකයන්ය.[29] (අබ්භූතධම්මං) අබ්භූතධම්මාන්ගයට මෙය ආශ්චර්ය අද්භූත ධර්මවශයෙන් යතරකි, ආදි ක්‍රමයෙන් දේශනා කළ සූත්‍රයන්ය.[30] (වෙදල්ලං) වෙදල්ලාන්ගයට මහාවෙදල්ල, චුල්ලවෙදල්ල, සම්මාදිට්ඨී,

---

[23] එම, තත්ථ උභතොවිභංගනිද්දෙසඛන්ධකපරිවාරා සුත්තනිපාතෙ මංගලසුත්තරතනසුත්ත නාලකසුත්තතුවටකසුත්තානි අඤ්ඤම්පි සුත්තනාමකං තථාගතවචනං සුත්තන්ති වෙදිතබ්බං.

[24] එම, සබ්බම්පි සගාථකං සුත්තං ගෙය්‍යන්ති වෙදිතබ්බං විසෙසෙන සංයුත්තකෙ සකලොපි සගාථක වග්ගො.

[25] එම, සකලං අභිධම්මපිටකං නිග්ගාථකං සුත්තං යඤ්ච අඤ්ඤම්පි අට්ඨහි අංගෙහි සංගහීතං බුද්ධවචනං තං වෙය්‍යාකරණන්ති වෙදිතබ්බං.

[26] එම, ධම්මපදං ථෙරගාථා ථෙරීගාථා සුත්තනිපාතෙ නො සුත්ත නාමිකා සුද්ධිකගාථා ච ගාථාති වෙදිතබ්බා.

[27] එම, සොමනස්සඤාණමයිකගාථාපටිසංයුත්තා ද්වේ අසීති සුත්තන්තා උදානන්ති වේදිතබ්බං.

[28] එම, වුත්තං හෙතං භගවතා'ති ආදිනයප්පවත්තා ද්වාසුත්තරස සුත්තන්තා ඉතිවුත්තකන්ති වෙදිතබ්බං.

[29] එම, අපණ්ණකාදිහි පඤ්ඤාසාධිකානි පඤ්චජාතකසතානි ජාතකන්ති වෙදිතබ්බං.

[30] එම, චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ'ති ආදිනයප්පවත්තා සබ්බේපි අච්ඡරිය අබ්භුතධම්මා පටිසංයුත්තන්තා අබ්භුත ධම්මන්ති වෙදිතබ්බං.

සක්කපඤ්ඤ, සංඛාරභාජනීය, මහාපුණ්ණම ආදි සූත්‍ර ඥාණ හා සතුට ලැබීමට විචාරණ සූත්‍රයන්ය.[31] ඉන් අනතුරුව මුලු බුද්ධවචනය අසූහාර දහසකට බෙදයි.[32] එයින් දෙදහසක් ශ්‍රාවක භාෂිත වශයෙන් බෙදා දක්වයි.[33]

- මෙහි භාවිත සියලු ත්‍රිපිටක ග්‍රන්ථ බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණ වන අතර අට්ඨකථා සියල්ල හේවාවිතාරණ මුද්‍රණ බව සලකන්න.

---

[31] එම, වෙදල්ල මහාවෙදල්ලසම්මාදිට්ඨි සක්කපඤ්ඤහ දංකාරභාජනීය මහාපුණ්ණමසුත්තාදයො සබ්බේ'පි වෙදඤ්ච තුට්ඨඤ්ච ලද්ධ ලද්ධා පුච්ඡිතසුත්තන්තා වෙදල්ලන්ති වෙදිතබ්බං.

[32] එම, චතුරාසීතිසහස්සවිධං සබ්බමෙව චෙතං බුද්ධවචනං.

[33] එම, ද්වාසීතිං බුද්ධතො ගණ්හිං ද්වේ සහස්සානි භික්ඛුතො,
චතුරාසීතිසහස්සානි යෙ මෙ ධම්මා පවත්තිතොති.